# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අන්තිම කැමති පත්‍ර (සංශෝධන)

**(60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 29 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අප්‍රේල් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[141 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 36.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් (මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" ලෙස හඳුන්වනු ලබන) (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, නව වගන්තියේ නීතිය බලපෑම වනුයේ අන්තිම කැමති පත්‍රයක් සැකසීමට අදාළ අවශ්‍යතා නිශ්චිතව දක්වාලීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එකී වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එකී වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

# අන්තිම කැමති පත්‍ර (සංශෝධන)

එල්.ඩී.—ඕ. 49/2021

## (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක    දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

60 වන අධිකාරයේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීම

2. (1) වයස අවුරුදු දහ අටට එළඹ ඇත්තා වූ සහ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නා වූ යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තාට අයත් සහ එකී තැනැත්තා විසින් පැවරීමක්, රික්තාවරණය කිරීමක් හෝ බැහැර කිරීමක් නොකළේ නම්, දේපළ දැරීමට නීත්‍යානුකූලව නුසුදුස්සකු නොවන එකී තැනැත්තාගේ උරුමකරුවන් වෙත පැවරෙන්නා වූ යම් නිශ්චල හෝ චංචල දේපළක් සහ යම් දේපළක සියලු සහ සෑම බූදල්, අයිතිවාසිකම්, කොටස් හෝ සම්බන්ධතා පැවරීමට සහ බැහැර කිරීමට අන්තිම කැමති පත්‍රයක් ලිවීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සෑම තෙස්තමේන්තුකරුවකුට ම තමා විසින් බැහැර කිරීමට අවශ්‍ය බවට සලකනු ලබන එවැනි තෙස්තමේන්තු නියාදනයක් සිදු කිරීම සඳහා පූර්ණ බලය තිබිය යුතු අතර, එම අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාවේ දැනට බලාත්මක වන හෝ මින් පෙර බලාත්මකව පැවති යම් නීතියක, භාවිතයක හෝ චාරිත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුව ද, බැහැර කිරීම, උරුමය අහිමි කිරීම හෝ සඳහන් නොකිරීම පිළිබඳ හේතු දැක්වීමෙන් තොරව එකී නියාදනයක දී

යම් ළමයකු, දෙමාපියකු, ඥාතියකු හෝ පැවත එන්නකුව බැහැර කිරීමට, එවැනි යම් තැනැත්තකුගේ උරුමය අහිමි කිරීමට හෝ එවැන්නකුව සඳහන් නොකර සිටීමට සෑම තෙස්තමේන්තුකරුවකුට ම පූර්ණ අයිතියක් ඇත්තේ ය:

එසේ වුව ද, යම් තෙස්තමේන්තුකරුවකුට අන්තිම කැමති පත්‍රයක් මඟින් එකී තෙස්තමේන්තුකරුගේ කලත්‍රයාට අයත් දේපළක් හෝ බූදලයක් බැහැර කරනු ලැබීමට හෝ, මෙම ආඥාපනත සම්මත නොවූයේ නම් එකී කලත්‍රයාට හිමිවන යම් දේපළක, බූදලයක හෝ සම්බන්ධතාවක ජීවිත හෝ වෙනත් අයිතියකින් එකී කලත්‍රයාව බැහැර කිරීමට හෝ එකී කලත්‍රයාට එකී අයිතිය අහිමි කිරීමට මෙහි සඳහන් කිසිවක් මඟින් බලය පැවරීමක් හෝ හිමිකම් ලබා දීමක් කරනු ලබන බවට හෝ අදහස් කරනු ලබන බවට සලකනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) මෙම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස අංකනය කිරීමෙන්; සහ

(2) එම නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) හවුල් අන්තිම කැමති පත්‍රයක තෙස්තමේන්තුකරුවකු මියයන අවස්ථාවක දී, අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීම සඳහා එම අන්තිම කැමති

පත්‍රය ද අමුණමින් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් හෝ ප්‍රොබේට් බලපත්‍රයක් ලබා ගැනීම පිණිස, අවස්ථාවෝචිත පරිදි, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXXVIII හෝ XXXVIIIආ පරිච්ඡේද යටතේ තෙස්තමේන්තු නඩු කටයුතු ගොනු කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ සඳහන් “එම ඉඩම මත ඉදිකරන ලද ගොඩනැගිලි” යන වචන වෙනුවට “එම ඉඩම මත ඉදිකරන ලද ගොඩනැගිලි, සහාධිපත්‍ය දේපළ කොටස හෝ ඉඩම් කොටස” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.